**ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මතය

------

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන් දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| ආදායම් සංකේතය | මූලික ඇස්තමේන්තුගත ආදායම | 2019 දෙසැම්බර් දිනට 31 තථ්‍ය ආදායම | ඉක්මවීම / (ඌනතාවය) මූලික ඇස්තමේන්තුවට සාපේක්ෂව | ඉක්මවීම / (ඌනතාවය) මූලික ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| 20.02.01.99 | 2,350 | 956.29 | (1,393.71) | (59.31) |
| 20.02.02.01 | 7,000 | 6,700.06 | (299.94) | (4.28) |
| 20.02.02.99 | 3,000 | 7,119.16 | 4,119.16 | 137.31 |
| 20.03.01.00 | 170 | 116,69 | (53.31) | (31.36) |
| 20.03.02.99 | 10,000 | 6,688.93 | (3,311.07) | (33.11) |
| 20.03.03.02 | 1,700 | 1,778.99 | 78.99 | 4.65 |
| 20.03.05.00 | 880 | 1,700.35 | 820.35 | 93.22 |
| 20.03.99.00 | 47,500 | 10,483.99 | 37,016.01 | (77.93) |
| 20.05.99.00 | 4,000 | 3,141.34 | (858.66) | (21.47) |
| 20.06.04.00 | 28,000 | 18,271.35 | (9,728.65) | (34.75) |
| 30.01.01.00 | 13,000 | 7,909.40 | (5,090.60) | (39.16) |
| | 117,600 | 64,866.55 | (52,733.45) | (44.84) |

ඉහත සඳහන් වගුවෙහි වූ තොරතුරු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉහත තොරතුරු අනුව, ආදායම් සංකේතාංක 08 ක මූලික ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 04 සිට සියයට 78 ක ඌනතාවයක් හා සංකේතාංක 03 ක සියයට 05 සිට සියයට 137 දක්වා ඉක්මවීම් පැවතියද, ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කිරීමට කටයුතු කරනොතිබුණි. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා රජයේ වියදම කුමන මට්ටමක තබා ගත යුතුද යන්න තීරණය කිරීම සඳහාත්, අයවැය පරතරය කෙතරම්ද යන්න තීරණය කිරීම සඳහාත් අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකතනය හා වාර්තා තබා ගැනීම විධිමත් කල යුතුය. | එකතු කරන ලද ආදායම්වලට පදනම් කරගන්නා නිර්ණායකයන් නිශ්චිත නොවන බැවින් සත්‍ය ආදායම හා ඇස්තමේන්තු අතර ප්‍රායෝගිකව වෙනස්කම් ඇතිවිය හැක. |
| ඉහත ආදායම් ගිණුම් සම්බන්ධයෙන් තව දුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.<br>**(අ) 20.02.01.99 දරන ආදායම් සංකේතය - අනෙකුත් කුලී** | | |
| **i. <u>පුගොඩ ටෙක්ස්ටයිල් ලංකා ලිමිටඩ් හා රමෝනා පුද්ගලික සමාගම</u>**<br>කොළඹ 11, මහ වීදියේ අංක 223 හා 227 දරන පරිශ්‍ර කුලී පදනම මත ලබාදීම සම්බන්ධයෙන් ඉහත ආයතන එළඹී තිබුණු ගිවිසුම ලිපි මගින් පමණක් දීර්ඝ කර තිබුණු අතර ඒ අනුව 2014 ජුනි 01 දින සිට 2019 මැයි 31 දක්වා කාලපරිච්ඡේදය තුළ මාසික කුලිය අඩු වී ඇති බව හා 2011 මැයි 31 දින සිට මේ දක්වා විධිමත් පරිදි ගිවිසුම් සඳහා එළඹී නොතිබීම හේතුවෙන් රජයට ලැබිය යුතු ආදායම අඩු වී ඇති බව නිරීක්ෂණය විය. | විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹිය යුතුවීම. | මෙය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු විෂයය පථයට අයත් වන බැවින් විමසුම එම දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලදී. |

**ii. චයිනා බේ ඔයිල් ෆාම් (China Bay Oil Farm)**

2003 පෙබරවාරි 07 දින සිට අවුරුදු 35 ක් දක්වා රජය හා ඉහත ආයතනය සමඟ එළඹි ගිවිසුම ප්‍රකාරව, අවුරුදු 05 කට වරක්, ඇමරිකා එක්සත් ජනපදයේ පූර්ව අවුරුදු 05 ක සමුච්චිත උද්ධමන අනුපාතය පදනම් කරගෙන (based on the cumulative rate of inflation of the united states for the proceeding (05) years) ස්වයංක්‍රීයව සංශෝධනය වියයුතු බව හා නිෂ්පාදන ධාරිතාව අනුව කුලිය ගැලපිය යුතු බව සඳහන් කර තිබුණි. එසේම අවබෝධතා ගිවිසුමේ 1.2 වගන්තියට අනුව ගබඩා පහසුකම් හා ඉඩමේ භුක්තිය සඳහා මාස 06 ක් ඇතුළත බදු කුලී ගිවිසුමකට එළඹිය යුතුව තිබුණු අතර එම බදු කුලී ගිවිසුම ක්‍රියාත්මක වූයේ නම් අදාළ බදු කුලී ගෙවීම් මෙම අවබෝධතා ගිවිසුම අනුව යාවත්කාලීන විය යුතු විය. එහෙත් මේ දක්වා අදාළ බදු කුලී ගිවිසුමට එළඹීමට හෝ අදාළ කුලී ගැලපීම අවබෝධතා ගිවිසුමේ සඳහන් ආකාරයෙන් ගැලපීමට නොහැකි වී තිබුණි.

ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ඇමරිකානු ඩොලර් 100,000 ක ආදායමක් ලැබෙන මෙම ගිවිසුම යාවත්කාලීන නොවීම, එහි ඇතුළත් කොන්දේසි ප්‍රකාරව කටයුතු නොකිරීම හා වත්කම් ප්‍රශස්ත ලෙස භාවිතා නොකිරීම හේතුවෙන් රජයට හිමිවිය යුතු ආදායම් අහිමි වන බව නිරීක්ෂණය විය.

විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹිය යුතුවීම.

මෙය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු විෂයය පථයට අයත් වන බැවින් විමසුම එම දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලදී.

**iii. Lanka Milk Food Limited (Pattipola &Ambewella)**

| | | |
|---|---|---|
| ගිවිසුමේ සඳහන් පරිදි එකවර වර්ෂයටම බදු කුලී අය නොවී වාරික 02 කදී කුලී ආදායම අයවීම නිසා එකවර මුදල් නොලැබෙන බව නිරීක්ෂණය විය. | ගිවිසුමේ සඳහන් කොන්දේසි ප්‍රකාරව බදු කුලී අය කර ගත යුතු වීම | ඉඩම සඳහා බදු කුලිය එම ආයතනය විසින් සෑම වසරකම ගිවිසුම්ගත දිනට ගෙවීමට එකඟ වී ඇත. 2019 වර්ෂයට අදාලව සම්පූර්ණ බදු මුදල ගෙවා ඇත. |

(ආ) **20.02.02.01 දරන ආදායම් සංකේතය - පොළිය - ණයදීම**

| | | |
|---|---|---|
| i. හිඟ පොලී ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට හිඟ පොලී ශේෂය රු. 2,368,167,107 ක් වී තිබුණි. | හිඟමුදල් අය කර ගැනීමට /නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | නාගරික සංවර්ධන අධිකාරියට අදාල දිගු කාලයක් හිඟව තිබූ රු.564,199,381 ක් 2019 වර්ෂයේදී අය කරගෙන ඇත. ඉතිරි හිඟ මුදල් ඉදිරියේදී කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| ii. 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04(ආ) ඡේදය ප්‍රකාරව අයවීමට ඇති හිඟ මුදල් තව තවත් එකතු වීම වැලැක්වීම සඳහා ක්ෂණික පියවර ගත යුතු වුවද 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු.2,368,169,107 ක හිඟ ශේෂය තුළ 2016 ට පෙර සිට පැවත එන ශේෂයන්ද ඇතුළත් බව නිරීක්ෂණය විය. | - එම - | ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව - දැනට අක්‍රිය මට්ටමේ පවතින බැවින් මුදල් අයකර ගැනීමේ හැකියාවක් නැත.<br>සණස සංගමය හා සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් - නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති වෙත යොමුකර ඇත.<br>ලංකා ධීවර සංස්ථාව - ආයතනයේ රු. මිලියන 960 ක් පමණ බැරකම් පවතින බැවින් පොළිය අත්හැර දැමීම සඳහා අනුමැතිය ලබා ගැනීමට තීරණය කර ඇත.<br>ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා මිල්කෝ සමාගම - පොළිය අත්හැර දැමීමට අවශ්‍ය ඉදිරි කටයුතු ගෙන ඇත. |

(ඇ) **20.03.02.99 දරන ආදායම් සංකේතය - විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් විවිධ -**

| | | |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රු.1,089,385 ක හිඟ ශේෂයක් පැවති අතර එම ශේෂය තුළ 2016 ට පෙර සිට පැවත එන ශේෂයන්ද ඇතුළත් බව නිරීක්ෂණය විය. තවද මෙම ණය ශේෂ සම්බන්ධයෙන් ඉහත (ආ) (ii) හි සඳහන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියා කළ යුතු අතර එපරිදි කටයුතු වන බවට නියාමනය ද කල යුතු වීම. | හිඟ ආදායම් එකතු කිරීම සඳහා අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කටයුතු කලයුතු වේ. මේ සඳහා අවශ්‍ය උපදෙස් අංක 05/2018 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය මඟින් ලබා දී ඇත. |

(ඇ) **20.05.99.00 දරන ආදායම් සංකේතය - වර්තන පැවරීම - ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම්**
**-------------------------------------**

| | | |
|---|---|---|
| i. සමාලෝචිත වර්ෂය තුළදී විවිධ අරමුදල් 08 කට අදාලව ලද එකතුව වූ රු. 4,572,986,527 ක් වූ ලොතරැයි මුදල් අදාළ අරමුදල පිහිටුවීමේ අරමුණුවලට යොදවා නොතිබුණි. | ආදායම් අදාළ අරමුණුවලට යෙදවිය යුතු වීම සහ ලොතරැයි මිලදී ගන්නන්ගේ දායකත්වයට නිසි යුතුකමක් ඉටු විය යුතු වීම. | විශේෂිත අරමුදල් වලට මුදල් ලබා දීම සඳහා වාර්ෂික අයවැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන්කරනු ලැබේ. මේ නිසා එකතුවන මුළු මුදලම අරමුදල් සඳහා යෙදවීමේ අවශ්‍යතාවයක් නැත. |
| ii. ලොතරැයි හතකට අදාළව ලද රු. 8,245,138,360.87 ක් කිසිදු ආයතනයකට / අරමුදලකට යොදා නොගන්නා බව නිරීක්ෂණය විය. | ආදායම් අදාළ අරමුණුවලට යෙදවිය යුතු වීම සහ ලොතරැයි මිලදී ගන්නන්ගේ දායකත්වයට නිසි යුතුකමක් ඉටු විය යුතු වීම. | ලොතරැයි ආදායම නිශ්චිතව එක් අරමුදලකට හෝ එක් ආයතනයකය වෙන්කරනු නොලැබුවද ඒකාබද්ධ අරමුදලට බැර කිරීම තුලින් සියළුම ආයතන වලට වෙන් කරනු ලබයි. |

**(ඉ) 20.06.04.00 දරන ආදායම් සංකේතය - ණය ආපසු අයකර ගැනීම**

--------------------------------------

| | | |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ආයතන 06 කින් අයවිය යුතු රු.10,047,406,028 ක හිඟ ශේෂයක් පැවති අතර එම ශේෂය තුළ 2016 ට පෙර සිට පැවත එන ශේෂයන්ද ඇතුළත් බව නිරීක්ෂණය විය. මෙම හිඟ ශේෂ සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සීමා සහිත ජාතික කඩදාසි සමාගම වෙත ලබාදුන් රු. 50,000,000 හා ලංකා පිගන් සංස්ථාව වෙත ලබාදුන් රු. 8,676,923 ක මුදල 2019 වර්ෂයේදී කපා හැර ඇති අතර නාගරික සංවර්ධන අධිකාරියට අදාල දිගු කාලයක් හිඟව තිබූ රු. 275,578,711 ක් 219 වර්ෂයේදී අය කරගෙන ඇත.<br>ඉතිරි ණය ශේෂයන් පියවන ලෙස අදාල ආයතන වෙත දන්වා යැවීමෙන් අනතුරුවත් එම ණය ශේෂ පියවීමට අදාල ආයතන අපොහොසත් වී ඇත. |

**(ඊ) 30.01.01.00 දරන ආදායම් සංකේතාංකය - විදේශීය ප්‍රදානයන්**

--------------------------------------

| | | |
|---|---|---|
| i. සමාලෝචිත වර්ෂය ආරම්භ වන විට ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.44,726,524 ක් පොදු තැන්පත් ගිණුම 14 ක රඳවා ගෙන තිබුණු අතර එම මුදල් අදාල අරමුණුවල නොයොදවා වර්ෂය අවසන් වන විටත් එසේම පැවතුණි. | ප්‍රදායකයින්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාල අරමුණුවලට යෙදවීම පිළිබඳ සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කළ යුතු වීම. | අදාල ප්‍රදාන නිසි සැළසුමක් අනුව උපයෝජනය කිරීම අදාල ප්‍රදාන ලබාගත් ආයතනයන්හි ප්‍රධාන ගණන්දීමේ නිලධාරි / ගණන් දීමේ නිලධාරීන් හා විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගේ සම්බන්ධීකරණයට යටත් වේ. |
| ii. ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.40,757,312 ක මුදලක් අදාල අරමුණු වල නොයොදවා වර්ෂය තුලදී රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. | ප්‍රදායකයින්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාල අරමුණුවලට යෙදවීම පිළිබඳ සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කළ යුතු වීම. | අදාල ව්‍යාපෘති දැනට ක්‍රියාත්මක නොවන මට්ටමේ පවතින බැවින් රජයේ ආදායමට බැර කරන ලදී. |

| | | |
|---|---|---|
| iii. එක් එක් ව්‍යාපෘති සඳහා විදේශ ආයතන හා රාජ්‍යයන් විසින් ලද විදේශ ප්‍රදාන එකී කාර්යයන් සඳහා උපයෝජනය නොකොට පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගැනීම නිසා ව්‍යාපෘති 06 කට අදාලව ලැබී තිබුණු රු.19,213,698 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුල එම ප්‍රදාන කරුවන් වෙත ආපසු යවා තිබුණි. | ලැබුණු විදේශ ප්‍රදාන උපරිම ලෙස උපයෝජනය කිරීමට අවධානය යොමු කළ යුතු වීම. | අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින් ප්‍රදානකරු වෙත ඉතිරි මුදල් ප්‍රේශණය කරන ලෙස කරන ලද ඉල්ලීම අනුව අදාල මුදල් යවා ඇත. |
| iv. සමාලෝචිත වර්ෂයේ PIV මඟින් ලැබී තිබූ රු.10,625,104 ක මුදලක් වර්ෂය අවසානය වන විටත් ප්‍රයෝජනයට නොගෙන ඉතිරි වී තිබුණි. | ලැබුණු විදේශ ප්‍රදාන අදාල අරමුණුවලට කාලීනව යෙදවීම පිළිබඳව නියාමනය කළ යුතු වීම. | විදේශ ප්‍රදාන ප්‍රයෝජනයට ගන්නා ලෙස අදාල අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු දැනුවත් කරනු ලැබේ. |
| v. තැන්පත් ගිණුම් අංක 6000-0-0-10-0-1116 යටතේ Strengthing Enforcement of Law Access to Justic & Social Intergration ව්‍යාපෘතිය සඳහා 2019 දෙසැම්බර් 31 දින ලැබී තිබුණි. මුළු මුදල වූ රු.1,923,158ක් ප්‍රයෝජනයට නොගෙන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | - එම - | අදාල මුදල උපයෝජනය කර නොමැති බව පෙනේ. උපයෝජනය කිරීම අදාල ප්‍රදාන ලබාගත් ආයතනයන්හි ප්‍රධාන ගණන්දීමේ නිලධාරි / ගණන් දීමේ නිලධාරීන් හා විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගේ සම්බන්ධීකරණයට යටත් වේ. |
| vi. තැන්පත් ගිණුම් අංක 6000-0-0-10-0-71 යටතේ World Health Organization Grants ව්‍යාපෘතිය සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනවලින් අවස්ථා 03 ක් යටතේ රු.2,899,935 ක මුදලක් ප්‍රදානකරුවන් වෙත ආපසු යවා තිබුණි. | - එම - | අදාල මුදල උපයෝජනය කර නොමැති බව පෙනේ. උපයෝජනය කිරීම අදාල ප්‍රදාන ලබා ගත් ආයතනයන්හි ප්‍රධාන ගණන්දීමේ නිලධාරි / ගණන් දීමේ නිලධාරීන් හා විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගේ සම්බන්ධීකරණයට යටත් වේ. |

(ඉ) **20.03.99.00 දරන ආදායම් සංකේතාංකය - විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්**

-------------------------------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලිසි 128(02) ප්‍රකාරව, එකතු කර ගැනීම සම්බන්ධයෙන් තමා වගකීමට බැඳී ඇති රාජ්‍ය ආදායමින් යම්කිසි කොටස් වෙනත් දෙපාර්තමේන්තු හා කාර්යාල මඟින් එකතු කරනු ලැබේ නම්, එම දෙපාර්තමේන්තුවලින් හා කාර්යාලවලින් වාර්තා ලබා ගෙන ඒවායේ සඳහන් කරුණු රාජ්‍ය ආදායම් ඇස්තමේන්තුවලටද අන්තර්ගත කරන බවට සහතික වන සේ ප්‍රමාණවත් විධිවිධාන යෙදීම සම්බන්ධයෙන් රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරියා වගකිව යුතු බව දැක්වේ. එසේ වුවද 2016 දෙසැම්බර් 30 දිනැති අංක 01/2015 (v) දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය මඟින් නිශ්චිතව එක් අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට විශේෂයෙන් පැවරිය නොහැකි මෙන්ම වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මඟින් රැස් කරනු ලබන ආදායම් සම්බන්ධයෙන් එම වගකීම අදාළ ආදායම් රැස් කරනු ලබන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් විසින් සිදු කළ යුතු බව ද සඳහන් කර තිබුණි.<br>මේ හේතුවෙන් ආදායම් ගිණුම විගණනයේදී අවශ්‍ය ලිපි ලේඛණ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. | ආදායම් ගිණුම් පිළිබඳ තොරතුරු නිවැරදිව පවත්වා ගත යුතු අතර නිවැරදි උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දීම මෙන්ම නියාමනය දැඩි කළ යුතු වීම. | මේ සඳහා අවශ්‍ය උපදෙස් අංක 05/2018 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය මඟින් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | **ආදායම් ඇස්තමේන්තු සංශෝධනය නොකිරීම**<br>---------------------------------------<br>ආදායම් සංකේත 11 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.117,600,000,000 ක ආදායම් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.65,735,634,334 ක් පමණක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 56 ක් පමණක් වී තිබුණි. ආදායම් සංකේත 03 ක් වෙනුවෙන් ඇස්තමේන්තු කළ ආදායම ඉක්මවා ආදායම් රැස්කර තිබුණු අතර එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 105 ක සිට සියයට 238 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වි තිබුණි. දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කිරීමට අපොහොසත් වි තිබුණි. | පාර්ලිමේන්තු මූල්‍ය පාලනය තහවුරු වන පරිදි කටයුතු කිරීමට උපරිම පරිශ්‍රමයක් දැරිය යුතු වීම. | 2020 වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව ඇතුළත් විසර්ජන පනත් කෙටුම්පතක් 2019 වර්ෂය අවසානයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොමැති බැවින් 2019 වර්ෂයට අදාළව සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව මගින් සම්මත කර නොමැති බව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක FP/RVN/01/100/05/01 හා 2020.02.10 දිනැති ලිපියෙන් දන්වා ඇත. |
| (එ) | ආදායම් සංකේත 07 ක සමාලෝචිත වර්ෂය අවසන් වන රු.12,428,196,376 ක ආදායම් හිඟහිටව පැවැතුණි. එම හිඟහිටි ආදායමෙන් රු.1,761,038,608 ක් වර්ෂයක කාලයක සිටද, රු.3,139,403,882 ක් වර්ෂ දෙකක කාලයක සිටදහා රු.7,527,753,886 ක් වර්ෂ 3 කට වැඩි කාලයක සිටද පැවැත එමින් තිබුණි. | හිඟ ආදායම් රැස් කිරීමට උපරිම ප්‍රයත්නයක් දැරි යුතු අතර නිරවුල් කිරීම් පිළිබඳව අවධානය යෙමු කළ යුතු වීම. | රු.12,428,196,376 ක් වන මුළු හිඟ ආදායමින් රු.12,415,674,134 ක් උපණය ලෙස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව, සණස සංගමය, සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන (ගැරන්ටි) ලිමිටඩ්, ලංකා ධීවර සංස්ථාව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා මිල්කෝ සමාගම වෙත ලබාදී ඇති මුදලින් හිඟ හිට ඇති ණය හා පොලී මුදල වේ. මෙම සියළුම ආයතන අක්‍රියතත්වයේ/ ණය ගෙවීමට නොහැකි තත්වයේ පවතින බැවින් මෙම හිඟ උපණය හා |

| | | |
|---|---|---|
| | | පොලී මුදල් අයකර ගැනීමට හැකියාවක් නොමැති අතර ඉදිරියේදී මෙම හිඟ මුදල් කපා හැරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි |

## 2.2 අක්මුදල් ගැලපුම් ගිණුම

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව රු.1,946,034,961,930 ක බැර ශේෂයක් දක්වා තිබුණු අතර දෙපාර්තමේන්තු පොත් අනුව එම ශේෂය රු.824,983 ක් වී තිබුණි. 2019 දෙසැම්බර් 03 දිනැති අංක අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ 7(vi) ඡේදය ප්‍රකාරව පිලියෙල කර තිබුණු අක් මුදල් ගැලැපීම් ගිණුමේ පහත සඳහන් වෙනස්කම් අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දෙපාර්තමේන්තුව රු.500,165,200 ක් වියදම් කර තිබුණත්, ගැලැපීම් ගිණුමේ එය රු.165,200 ක් අඩුවෙන් එනම් රු.500,000,000 ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම පිළියෙල කළයුතු වීම. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් පරිදි මෙම දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ගිය නිලධාරියකුගේ ණය ශේෂය වන රු.165,200.00ක මුදල හරස් සටහන් මඟින් පියවා ගැනිමට කටයුතු කල බැවින් එම අක්මුදල් ගැලපුම් ගිණුමට ඇතුලත් නොකිරිමට තිරණය කරන ලදී. කෙසේවෙතත් ඔබගේ නිරීක්ෂණය පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ජා කර ඉදිරියේදී ඉදිරිපත් කර ගැනීමට සටහන් කරගන්නා ලදී. |
| (ආ) දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්ෂුම අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශවල සඳහන් වටිනාකම් සමඟ පිළිවෙලින් රු.796,479 ක් හා රු.414,407 කින් වෙනස් වී තිබුණි. එම වෙනස්වීම් අක්මුදල් ගැලැපුම් ගිණුමේ රු.5,900,984 ක් හා රු.5,353,712 ක් වශයෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම පිළියෙල කළයුතු වීම. | අප දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුම්වලට අදාලව මුදලින් සිදු නොවූ හරස් සටහන් ලැබීම් සහ ගෙවීම් ඇතුලත් කර අක් මුදල් ගැලපුම් ගිණුම සකස්කර ඇති අතර වෙනත් දෙපාර්තමේන්තු විසින් වැරදි ලෙස ගිණුම් තබන ලද ගනුදෙනු සැලකිල්ලට ගෙන නොමැත. |

## 2.3 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විගණන නිරීක්ෂණය**

(අ) වැය විෂයයන් 08 ක් යටතේ එකතුව රු. 1,193,539,031 ක් වූ අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 26 සිට සියයට 89 දක්වා වූ පරාසයක් තුළ ප්‍රතිපාදන ඉතිරිවීම් නිරීක්ෂණය විය. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, වාර්ෂික අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.

**නිර්දේශය**

වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කලයුතු වීම.

**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**

ඔබ විසින් දක්වා ඇති පහත වැය විෂයයන්ගේ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවදුරටත් ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු පහත පරිදි විය.

| වැය විෂයය | වෙනස්කම්වලට හේතු |
| --- | --- |
| 249-1-1-0-1102/11 | විදේශ ගමන් අවස්ථා නොලැබීම සහ ජනාධිපති ලේකම්ගේ 2019.11.19 දිනැති උපදෙස් ලිපියට අනුකූලව මෙම වැය විෂය යටතේ අරපිරිමැසුම්දායක ලෙස වියදම් කළමනාකරණය කර ගැනීම |
| 249-1-1-0-1503/11 | ජාතික ලොතරැයි මණ්ඩලය මඟින් භාණ්ඩාගාරය වෙත ලබා දෙන ලද මුදලින්, අදාල ආයතනවලින් කරනු ලබන ඉල්ලීම් පදනම් කරගෙන හා භාණ්ඩාගාරයේ මුදල් තත්ත්වය සැලකිල්ලට ගෙන නිදහස් කිරීම. |
| 249-1-1-0-2001/11 | ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් 15% ක් ඉතිරි කරන ලෙස ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් තවදුරටත් 10% ක් ඉතිරි කරන ලෙස ලද උපදෙස් මත ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ වියදම් සැලසුම් කල පරිදි සිදු නොකිරීම. |

| | |
|---|---|
| 249-1-1-0-2003/11 | වාහන නඩත්තු වියදම් අපේකෂා කල පරිදි ඇති නොවීම හා වසර 10 කට වඩා පැරණි කාර් රථයක් අපහරණය කිරීම |
| 249-1-1-0-2102/11 | මිලදී ගැනීමට නියමිතව තිබූ කාර්යාල උපකරණ මිලදී නොගැනීම. |
| 249-1-1-0-2401/11 | 2019 වර්ෂයේ අයවැය චක්‍රලේඛ උපදෙස් පරිදි වියදම් පාලනය කිරීම. |
| 249-1-1-1-1505/11 | අපේකෂා කල පරිදි දායක මුදල් ගෙවීමට ඉදිරිපත් නොවීම. |
| 249-1-2-0-3001/11 | අපේක්ෂා කල පරිදි වර්ෂය තුල ගෙවීම් ඉදිරිපත් නොවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 අප්‍රෙල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රෙල්ඛයේ 05 වන ඡේදය ප්‍රකාරව විධිමත් පරිදි ලබා ගන්නා ලද භාණ්ඩ, සේවා හා සම්පූර්ණ කර ඇති බවට සහතික කර ඇති කොන්ත්‍රාත් සඳහා තව දුරටත් ගෙවිය යුතු වටිනාකම බැරකම් වශයෙන් නිර්වචනය කර ඇත. චක්‍රෙල්ඛයේ 2 (ඇ) ඡේදය ප්‍රකාරව සියළුම බැරකම් එම වර්ෂය තුලදී මුදල් ගෙවා නිදහස් කල යුතු අතර කිසිදු බැරකමක් ඊලග වර්ෂය තුල නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතුය. එසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii)හි රු. 1,318,115 ක බැරකම් දක්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකල යුතු වීම. | දෙපාර්තමේන්තුවේ අත්‍යාවශ්‍ය රාජකාරී සඳහා කාර්යාලීය වේලාවෙන් බැහැරව, 2019 දෙසැම්බර් මාසයේදී නිලධාරීන් රාජකාරී කටයුතු සඳහා යෙදවීමට සිදුවීමෙන් ඔවුන්ගේ දීමනා ගෙවීමට මෙන්ම දෙපාර්තමේන්තුවට අවශ්‍ය සන්නිවේදන හා පානිය ජලය ලබා ගැනීමට අදාලව2019 දෙසැම්බර් මාසයේ බිල්පත් සඳහා සිදු කල ගෙවීම් බැරකම් ලෙසින් දක්වා ඇති අතර ඒ සඳහා එම අවස්ථාවේදී ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. |

## 2.4 මූල්‍ය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සඳහන් සංඛ්‍යා භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යා සමඟ එකඟ විය යුතුව තිබුණි. ඒ අනුව අග්‍රිම ගිණුමේ ශේෂය රු.824,983 ක් විය යුතුව තිබුණත්, එය රු.170,087 ක් අඩුවෙන් රු.654,896 ක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකල යුතු වීම. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව 2019/12/31 දිනට මුදල් පොත පියවා අවසාන ශේෂය වන රු.170,087.00ක මුදල භාණ්ඩාගාරය වෙත පියවා ඇති නමුත් එය 2019.12.31 දින යටතේම භාණ්ඩාගාර පරිගණක ප්‍රකාශණ වල සඳහන් නොවන හෙයින් මෙම වෙනස සිදුව ඇති අතර දෙපාර්තමේන්තු විසින් සිදු කරන ලද ගනුදෙනු පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට නිරවුල් කර නොතිබුණු අග්‍රිම ගිණුමේ ශේෂයෙන් රු. 654,896 ක් වූ අත්තිකාරම් ගෙවීම ලැබිය යුතු අත්තිකාරම් ලෙස ජංගම වත්කම්වල දක්වා තිබුණි. | ගිණුම්වල නිවැරදි තොරතුරු ඇතුළත් කළයුතු වීම. | මැතිවරණ රාජකාරී සඳහා සේවය කල නිලධාරීන්ට ගෙවන ලද දීමනා මැතිවරණ කාර්යාලය විසින් ප්‍රතිපූරණය කර නොමැති බැවින් තව දුරටත් ලැබිය යුතු රු.654,896/- මුදල, ජංගම වත්කම් යටතේ මුදල් හා මුදල් සමාන දෑ ලෙස දක්වා ඇත.<br>කෙසේ වෙතත් 2019.12.31 දිනට නොපියවී පැවති සියළුම අග්‍රිම ශේෂයන් මේ වන විට පියවා නිරවුල් කර ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතර භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය හා වියදම් ආයතව වල අරමුදල් අවශ්‍යතා තක්සේරුකර ප්‍රමුඛතා මත අක් මුදල් නිදහස් කිරීම ඇතුලත් විය. ඊට අදාලව විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.බිලියන 2,416.74 ක ප්‍රතිපාදන සඳහා රු.බිලියන 1,400.34 ක්ද, රු.බිලියන 3,428.19 ක මුලධන ප්‍රතිපාදන වෙනුවෙන් රු.බිලියන 609.14 ක්ද වශයෙන් එකතුව රු.බිලියන 2,009.48 ක අක්මුදල් සීමාවන් පනවා තිබුණි. එහෙත් විවිධ ආයතන විසින් එම ප්‍රමාණයන් ඉක්මවා පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.බිලියන 1,530.78 ක්ද, මුලධන වියදම් වෙනුවෙන් රු.බිලියන 906.85 ක්ද, වශයෙන් එකතුව රු.බිලියන 2,437.63 ක අක්මුදල් ඉල්ලුම් කර තිබුණි. නමුත් භාණ්ඩාගාරය විසින් එසේ ඉල්ලුම් කළ අක් මුදලින් නිකුත් නොකර අවම වශයෙන් අක්මුදල් සීමාවටද වඩා අඩුවෙන් වූ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.බිලියන 1,338.31 ක්ද, මුලධන වියදම් වෙනුවෙන් රු.බිලියන 395.72 ක්ද, වශයෙන් එකතුව රු.බිලියන 1,734.03 ක අක් මුදල් ආයතන වෙත නිදහස් කර තිබුණි. ඒ අනුව පුනරාවර්තන වියදම් වෙනුවෙන් ආයතන විසින් ඉල්ලුම් කළ අග්‍රිමයෙන් රු.බිලියන 192.47 ක හෙවත් සියයට12.57 ක්ද, මූලධන වියදම් වෙනුවෙන් ආයතන විසින් | මුදල් ප්‍රවාහ කළමනාකරණය හා වියදම් ආයතව වල අරමුදල් අවශ්‍යතා තක්සේරුකර අක් මුදල් නිදහස් කිරීම උපරිම කල යුතු වීම. | අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වෙත භාණ්ඩාගාරය විසින් මූලධන හා පුනරාවර්තනවියදම් සඳහා අක් මුදල් නිදහස් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.<br>i. වාර්ෂික විසර්ජන පනතේ අදාල වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් මත පදනම්ව ඒ ඒ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු යටතේ ගණනය කරන ලද වාර්ෂික අක් මුදල් සීමාව සලකා බැලීම.<br>ii. ඒ ඒ අමත්‍යාංශ / දෙපාර්තමේන්තුව විසින් දෛනිකව/ මාසිකව කරන ලද අක් මුදල් ඉල්ලීම හා ඒ මත ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති නිර්දේශයන් සලකා බැලීම.<br>iii. ඒ ඒ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට අයත් නිල බැංකු ගිණුම් වල පවතින දෛනික බැංකු/ මුදල් ශේෂයන් පිළිබඳව සලකා බැලීම.<br>iv. ඒකාබද්ධ අරමුදල යටතේ |

ඉල්ලුම් කළ අග්‍රිමයෙන් රු.බිලියන 213.42 ක් හෙවත් සියයට 53.93 ක්ද, වශයෙන් එකතුව රු.බිලියනව 405.89 ක අක්මුදල් භාණ්ඩාගාරය විසින් නිදහස් කර නොතිබුණි. කෙසේ වුවද රජයේ මූල්‍ය ප්‍රකාශනවල උපලේඛන III හි සඳහන් බැදීම් හා බැරකම් ලැයිස්තුව අනුව පුනරාවර්තන වියදම් සඳහා එකතුව රු.බිලියන 73.06 ක්ද, රු.බිලියන 91.51 ක්ද, වශයෙන් එකතුව රු.බිලියන 164.57 ක බැරකම් දක්වා තිබුණි.

පවතින මුදල් තත්වයන් සලකා බැලීම.

v. ඉහළ කළමනාකාරීත්වයේ උපදෙස් පරිදි එම ජාතික අවශ්‍යතාවයන් මත පදනම්ව ලබා දිය යුතු ප්‍රමුඛතාවයන් පිළිබඳව සලකා බැලීම.

vi. රාජ්‍ය ණය සේවාකරණය සඳහා ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කිරීම

**(ආ)** රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් විය. විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතුව තිබුණු රාජ්‍ය ණය ශේෂය රු. මිලියන 12,187,858 ක් වුවද, නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණයවූ පහත සඳහන් තොරතුරු අනුව එම ණය ශේෂය රු. මිලියන 701,152 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

| **බැරකම්** | **2019 දෙසැම්බර් 31 දිනටබැරකම් වටිනාකම*** |
|---|---|
| | **රු. මිලියන** |
| මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම්ගත නොකළ ණය | |
| - ගිණුම්වලට ඇතුලත් නොකළ හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගත් ණය | 172,717 |
| - භාණ්ඩාගාර බැඳුම්කර ශේෂය අඩුවෙන් ගිණුම්ගත කිරීම | 318,246 |
| - ගිණුම්ගත නොකළ විදේශ ණය | 210,189 |
| එකතුව | ----------- 701,152 ====== |

රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කලයුතු වීම.

- හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘති (ණය අංක - 2007044, 2012032, 2012033 සහ 2013014) ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් කල්බදු ගිවිසුමක් යටතේ පවරා ඇති නමුදු, එකී වත්කමෙහි තවදුරටත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුවන අතර එය ගොඩනැගීම සඳහා ලබාගන්නා ලද ණය මුදල ද එම අධිකාරියේ වගකීමක් වේ.
- භාණ්ඩාගාර බැඳුම්කරවල 2016 ට පෙර නිකුත්කරන ලද බැඳුම්කරවල අවමිල ගිණුම්ගත කිරීම සඳහා රුපියල් බිලියන 318 ක ප්‍රතිපාදන වෙන්කර ගත යුතුව ඇති නමුත්, ප්‍රායෝගිකව එවැනි විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කිරීම අයවැය හිඟය ඉහළ යාමට හේතුවනු ඇත. එබැවින්, 2016 ට පෙර නිකුත් කළ බැඳුම්කරවලට අදාළ අවමිල එම බැඳුම්කර කල්පිරෙන වර්ෂයේදී ගැලපීම් කිරීමටත් එතෙක් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් ලෙස එම බැඳුම්කරවල මුහුණත අගය

| | | | |
|---|---|---|---|
| | | | හෙළිදරව් කිරීමටත් පියවර ගෙන ඇත.<br>• 2019 වර්ෂයේ වාර්ෂික විසර්ජන පනතේ ප්‍රමාණාත්මක ප්‍රතිපාදන වෙන්කරනොතිබියදී භාණ්ඩාගාරයේ පාලනයෙන් බැහැරව ඇතැම් අමාත්‍යාංශවල ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතින්හි ප්‍රතිලබ්ධීන් සිදුවී තිබීමත්, ප්‍රතිපාදන පැවතිය ද 2019 වර්ෂයේ ගිණුම් පියවන අවස්ථාව වන විට ගිණුම් ගත කිරීම සඳහා ඉදිරිපත් නොවීමත් මෙන්ම වාර්ෂික ණයගැනීම් සීමාව වැඩිකර ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට සැලසුම් කළ පනත් කෙටුම්පත සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට අවස්ථාවක් නොලැබීමත් යන කරුණු හේතුවෙන් ගිණුම්ගත කිරීම සඳහා ඉදිරිපත් වූ ඇතැම් ප්‍රතිලබ්ධීන් ගිණුම් ගත කිරීමට නොහැකි විය. |
| **(ඇ)** | විදේශ ආධාර ගිණුම් තැබීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, 2018 හා 2019 වර්ෂවල මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 24 ක් විසින් ව්‍යාපෘති 77 ක් සඳහා රු. මිලියන 2,026 ක විදේශ ප්‍රදාන ඍජුවම අදාළ ආයතන වෙත ලබාගෙන තිබුණු අතර මෙම ප්‍රදානයන් පිළිබඳ තොරතුරු මහා භාණ්ඩාගාරයේ වාර්තාවල ඇතුළත් වී නොතිබුණි. එසේම, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත මෙවැනි ප්‍රදාන ලැබී තිබේද යන වග තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් මහා | විදේශ ආධාර ලබා ගැනීමේ හා ගිණුම් තැබීමේ ක්‍රියාවලිය විධිමත් කළයුතු වීම සහ නියාමනය ශක්තිමත් කර චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම පිළිබඳව දැඩි පියවර ගත යුතු වීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 න් සංශෝධිත 2.0 ඡේදය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ XI පරිච්ඡේදයෙහි වූ විධිවිධාන නොසළකා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනු දැනුමකින් තොරව ඍජුවම විදේශ ප්‍රදාන ලබාගන්නා රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස රේඛීය අමාත්‍යාංශය භාර ලේකම්වරුන් වෙත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාරය සතුව නොමැති බව නිරීක්ෂණය විය. | | (i) චක්‍රලේඛ විධිවිධාන නොසළකා ලබාගත් සෘජු විදේශ ප්‍රදාන වහාම විධිමත් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙස.<br>(ii) ඉදිරියේදී කිසිදු හේතුවක් නිසාවෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමකින් තොරව/ අනුමැතිය ලබාගැනීමකින් තොරව විදේශ ප්‍රදාන ලබාගැනීමට කටයුතු නොකළ යුතු බව. |
| **(ඇ)** | 2019 දෙසැම්බර් 31 දින වනවිට මහා භාණ්ඩාගාරය විසින් වාණිජ බැංකු 02 ක් හා එක් ආයතනයක් වෙත නිකුත් කරන ලද රු. මිලියන 8,476 ක් වටිනා සහන ලිපි 07 ක් හා එක්සත් ජනපද ඩොලර් මිලියන 10 (රු. මිලියන 1,816.34) ක් වටිනා සහන ලිපි 04 ක් කල් ඉකුත් වී තිබුණි. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් හා යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම | **ලංකා ස.තො.ස. ආයතනය**<br>අංක 19/1659/108/147 හා 2019.05.30 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ලංකා ස.තො.ස. ලිමිටඩ් වෙනුවෙන් නිකුත් කරන ලද පහසුකම් සැලසීමේ ලිපි තුනක් යටතේ ලබාගෙන ඇති ණය මුදල් හා ගෙවීමට ඇති පොලී මුදල්වල එකතුව වන රු. බිලියන 9.8ක මුදල කාලීන ණය මුදලක් බවට පරිවර්තනය කර 11% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ මහා භාණ්ඩාගාරය විසින් ලංකා බැංකුව හා මහජන බැංකුව වෙත ගෙවීමටත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමටත් 2019.06.25 දින අමාත්‍ය මණ්ඩලය මගින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, මහා භාණ්ඩාගාරය විසින් එම ණය මුදල් පියවීමේ කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුව මෙම සහන ලිපි අවලංගු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.<br>**සමූපකාර තොග වෙළඳ සංස්ථාව**<br>සමූපකාර තොග වෙළඳ සංස්ථාව (ස.තො.ස.) විසින් වී අලෙවි මණ්ඩලයෙන් වී තොග ලබාගැනීම සඳහා නිකුත් කරන ලද රු. මිලියන 880ක පහසුකම් සැලසීමේ ලිපි දෙකක් යටතේ ලබාගෙන ඇති වී තොගවලට අදාළ මුදල් පියවීමට |

| | | | |
|---|---|---|---|
| | | | කටයුතු කරන ලෙස සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව හා අදාළ විෂය භාර අමාත්‍යාංශය හා ස.තො.ස. ආයතනය වෙත දැනුම් දී ඇති අතර දැනට ස.තො.ස. ආයතනය සතුව පවතින තොග විකිණීමෙන් හා ලංකා ස.තො.ස. වෙතින් ස.තො.ස. ආයතනය වෙත ලැබිය යුතු මුදල් ලැබූ පසු එම ණය මුදල් පියවන බවට ස.තො.ස. ආයතනය විසින් දැනුම් දී ඇත. මේ වන විට එහි නොපියවූ ශේෂය රු. මිලියන 689.6 දක්වා අඩු වී ඇත.<br>**මිහින් ලංකා සමාගම**<br>මිහින් ලංකා සමාගම වෙනුවෙන් ලංකා බැංකුව හා මහජන බැංකුව වෙත නිකුත් කරන ලද පහසුකම් සැලසීමේ ලිපි හයෙහි වලංගු කාලය දීර්ඝ කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු දැනට කරමින් පවතී. |
| **(ඉ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 373 ප්‍රකාරව, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අග්‍රිම ගිණුම් ශේෂයන් සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත්, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 03 ක එකතුව රු.මිලියන 324 ක් වූ ගිණුම් ශේෂ එසේ නිරවුල් කර නොතිබුණි. | අධීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කල යුතු වීම. | 2019.12.31 දිනට තවදුරටත් නොපිය වී පවතින අග්‍රිම ගිණුම් සැසඳීම් කර නිරවුල් කරන ලෙසට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දැනුවත් කර ඇත.<br>ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන්නේ අදාල ශේෂ පියවීමේ කටයුතු අධීක්ෂණය පමණකි. |